… ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1781/45 - 2012 ඔක්තෝබර් මස 26 වැනි සිකුරාදා - 2012.10.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**වීදුරු භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33 (1)(අ) වැනි වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් පනවනු ලැබ 1979 ඔක්තෝබර් මස 12 දින අංක 58 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් කම්කරු කොමසාරිස් වෙත පවරනු ලැබූ බලය අනුව, කම්කරු කොමසාරිස් වී. බී. පී. කේ. වීරසිංහ වන මම, වීදුරු නිෂ්පාදන කර්මාන්තයේ නියුක්ත කම්කරුවන් සම්බන්ධයෙන් මීට යාකොට ඇති උපලේඛනයේ දැක්වෙන කාලම්මේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණය එම ආඥාපනතේ 33(2) වැනි වගන්තිය යටතේ තීරණය කිරීමට අදහස් කරන බව ඉහත කී ආඥාපනතේ 28 වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමි.

යෝජිත තීරණයට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතා 2012 නොවැම්බර් මස 21 දින මධ්‍යාහ්න 12.00 දක්වා මවිසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන ඒ සෑම විරෝධතාවයක්ම එසේ වීමට හේතුවූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2012 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

කම්කරු කොමසාරිස් විසින් වීදුරු භාණ්ඩ නිපදවීමේ කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන්ගේ කාලම්මේ වැඩ සඳහා වන අවම වේතනවලට අදාළව 1980 ජූනි 26 වැනි දින අංක 94/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයේ උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇත්තාවූ ද කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද අවසන් වරට 2010.05.31 වැනි දින අංක 1656/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද උපලේඛනය පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කරනු ලැබේ.

වීදුරු භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයෙහි නියුක්ත I වැනි තීරුවේ සඳහන් කම්කරුවන්හට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාල විය යුතු අවම වේතන ප්‍රමාණය II වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන පරිදි විය යුතු ය.

| *I වැනි තීරුව සේවක පන්තිය* | *II වැනි තීරුව වැඩකරන දවස් සඳහා වූ අවම වේතන ප්‍රමාණය රු. ශත.* |
|---|---|
| (අ) පිඹුම්කරු, යන්ත්‍රකරු | 510.00 |
| (ආ) සහාය යන්ත්‍ර ක්‍රියාකරු බුබුලුකරු, කැපුම්කරු, සහාය පිඹුම්කරු, උදුන්කරු | 450.00 |
| (ඇ) ගිනියම්කර මට්ටම්කරන්නා හුලං ගහන්නා, බර ඇසුරුම්කරු, සහාය බුබුලුකරු | 427.50 |
| (ඈ) කණිෂ්ඨ බුබුලුකරු, හැඩ සමකරන්නා, හරවන්නා, ගණන් කරන්නා | 412.50 |
| (ඉ) කැපුම්කරු, විමිනි කැපුම්කරු, මට්ටම්කරු | 397.50 |
| (ඊ) ඇසුරුම්කරු, ගෙනයන්නා | 375.00 |

**වැඩකරන සාමාන්‍ය දවස**

(කෑම ගැනීම, තේ විවේකය සඳහා පැයක් ඇතුළුව) සාමාන්‍ය දවසක්

| | |
|---|---|
| (අ) සෙනසුරාදා හැර වෙන ඕනෑම දවසක් | පැය 09 |
| (ආ) සෙනසුරාදා දවසක | පැය 06 |

11 - 377/1

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පෙර පාසල් සේවා කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33 (1)(අ) වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් පනවනු ලැබ 2000 පෙබරවාරි මස 21 දින අංක 1120/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් මා වෙත පවරනු ලැබූ බලය අනුව, කම්කරු කොමසාරිස් වී. බී. පී. කේ. වීරසිංහ වන මම පෙර පාසල් සේවා කර්මාන්තයේ නියුක්ත ගුරුවරුන් සහ සහායකයින් සම්බන්ධයෙන් පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන අවම වේතන ප්‍රමාණය එම ආඥාපනතේ 33(2) වැනි වගන්තිය යටතේ තීරණය කිරීමට අදහස් කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමි.

යෝජිත තීරණය පිළිබඳව දැක්වෙන විරෝධතාවයන් 2012 නොවැම්බර් මස 21 දින මධ්‍යාහ්න 12.00 දක්වා මවිසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාව දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2012 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

කම්කරු කොමසාරිස් විසින් පෙර පාසැල් කර්මාන්තයෙහි නියුක්ත ගුරුවරු හා සහායකයින්ගේ කාලමිම්මේ වැඩ සඳහා වන අවම වේතන වලට අදාළව කරන ලද 2010.05.31 දින අංක 1656/10 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයේ දැක්වෙන උපලේඛනය වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

| *පළමුවන තීරය (ප්‍රදේශය)* | *දෙවන තීරය (වෘත්තිය)* | *තුන්වන තීරය (අවම මාසික වේතනය) රු. ශත.* |
|---|---|---|
| මහ නගර සභා සීමාව තුළ | (අ) ගුරුවරුන් | 9,750.00 |
| | (ආ) සහායකයින් | 7,500.00 |
| නගර සභා සීමාව තුළ | (අ) ගුරුවරුන් | 8,740.00 |
| | (ආ) සහායකයින් | 6,975.00 |
| ප්‍රාදේශීය සභා සීමාව තුළ | (අ) ගුරුවරුන් | 7,050.00 |
| | (ආ) සහායකයින් | 5,740.00 |

ඉහත (ආ) සළකුණෙන් දැක්වෙන සේවාවන්ට ඉහත (අ) සළකුණෙන් දැක්වෙන සේවාවට ආනුෂාංගික වූ කිසියම් සේවාවක් වේ නම් ඒවාද ඇතුළත් වේ.

11 - 377/2

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**බතික් කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥා පනතේ 33 (1)(අ) වැනි වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් පනවනු ලැබ, 1979 අගෝස්තු මස 3 වන දින අංක 48 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් මා වෙත පවරණු ලැබූ බලය ප්‍රකාරව කම්කරු කොමසාරිස් වී. බී. පී. කේ. වීරසිංහ වන මම, බතික් කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන් සම්බන්ධයෙන් මීට යාකොට ඇති උපලේඛනයෙහි දැක්වෙන කාලමිම්මේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණය එම ආඥාපනතේ 33(2) වැනි වගන්තිය යටතේ තීරණය කිරීමට අදහස් කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තියේ යටතේ මෙයින් නිවේදනය කරමි.

යෝජිත තීරණයට දැක්වෙන විරෝධතා 2012 නොවැම්බර් මස 21 දින දහවල් 12.00 දක්වා ම'විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එම විරෝධතාවය දැක්වීමට හේතුවූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2012 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

කම්කරු කොමසාරිස් විසින් බතික් කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන්ගේ කාලමිම්මේ වැඩ සඳහා වන අවම වේතනවලට අදාළව 1979.11.30 වැනි දින අංක 64/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරාත්මකව දක්වා ඇත්තාවූ ද කලින් කලට වෙනස් කරන ලද්දා වූද අවසන් වරට 2010 මැයි මස 31 වැනි දින අංක 1656/10 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයට පහත දැක්වෙන කොටස් ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කරනු ලැබේ.

බතික් කර්මාන්තයෙහි නියුක්ත 1 තීරයෙහි සඳහන් කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාල විය යුතු අවම වේතන ප්‍රමාණය II වැනි තීරයෙහි අනුරූප සටහනෙහි දැක්වෙන පරිදි විය යුතුය.

| *I වැනි තීරය*<br>*සේවක පන්තිය* | *II වැනි තීරය*<br>*වැඩකරන දවසක් සඳහා වූ වේතන ප්‍රමාණය*<br>*රු. ශත.* |
|---|---|
| (අ) චිත්‍ර ශිල්පී, මෝස්තරකරු | 525.00 |
| (ආ) තම්බන්නෝ, සායම් පොවන්නෝ | 450.00 |
| (ඇ) මදින්නෝ, පිටපත් ගන්නෝ, ඉටි කරන්නෝ | 412.50 |

**වැඩ කරන සාමාන්‍ය දවස**

වැඩකරන සාමාන්‍ය දවස් (කෑම ගැනීම හෝ තේ විවේකය සඳහා පැයක් ඇතුළුව) වැඩ කරන සාමාන්‍ය දවසක් සමන්විත වන පැය ගණන පහත සඳහන් පරිදි විය යුතු ය.

| | |
|---|---|
| (අ) සෙනසුරාදා හැර වෙන ඕනෑම දවසක් | පැය 09 |
| (ආ) සෙනසුරාදා දවසක | පැය 06 |

11 - 377/3

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**දුම්කොල කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට දුම්කොල කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභාවේ ආඥා නතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2012 නොවැම්බර් මස 21 දින මධ්‍යාහ්න 12.00 දක්වා, එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ. එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතා දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතුය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
දුම්කොල කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

දුම්කොළ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව, 1966 අප්‍රේල් මස 28 වැනි දින අංක 14,629/6 දරන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූද කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද අවසන් වරට 2010 ජූනි මස 30 දින අංක 1660/35 දරන *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද දැන්වීම් වලින් වෙනස් කරන ලද්දා වූද තීරණ එම උපලේඛනයෙහි II කොටස වෙනුවට පහත කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් සංශෝධනය කළ යුතුය.

කම්කරුවකු (පිරිමි/ගැහුණු) වෙනුවෙන් වැඩ කරන සාමාන්‍ය දිනකට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණය රු. 500.00 කි.

11 - 377/4

---

**පඩිපාලක සභා ආඥා පනත**

නිවේදනයයි

**රබර් (ටයර් නිෂ්පාදන හා නැවත පිරවීම ඇතුළුව) ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥා පනතේ 30 වැනි වගන්තියෙන් රබර් (ටයර් නිෂ්පාදන හා නැවත පිරවීම ඇතුළුව) ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එම උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව අදහස් කරන බව එකී ආඥා පනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව එම පඩිපාලක සභාව විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතා 2012 නොවැම්බර් මස 21 දින මධ්‍යාහ්න 12.00 දක්වා පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරෝධතාවක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතුය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
රබර් (ටයර් නිෂ්පාදන හා නැවත පිරවීම ඇතුළුව)
ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ
නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

රබර් (ටයර් නිෂ්පාදන හා නැවත පිරවීම ඇතුළුව) ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් 1968 දෙසැම්බර් මස 06 වැනි දින අංක 14831 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද සහ අවසන් වරට 2010 ජූනි මස 30 දින අංක 1660/35 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පලකරන ලද නිවේදනයේ වෙනස් කරන ලද්දා වූද තීරණයන් එම උපලේඛනයෙහි II වැනි කොටසේ 'මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය' යන ශීර්ෂය යටතේ දැක්වෙන කොටස වෙනුවට පහත සඳහන් ආදේශය කිරීමෙන් තව දුරටත් වෙනස් කරනු ලැබේ.

II වැනි කොටස

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| සේවා වසර | නුපුහුණු | අඩ පුහුණු | පුහුණු | වෘත්තීය පුහුණු හදාරන්නන් අධුනිකයන් |
|---|---|---|---|---|
| | රු. ශත. | රු. ශත. | රු, ශත. | රු. ශත. |
| 1 වසර | 9,315.00 | 9,720.00 | 10,125.00 | 5,520.00 |
| 2 වසර | 9,415.00 | 9,845.00 | 10,275.00 | 5,720.00 |
| 3 වසර | 9,515.00 | 9,970.00 | 10,425.00 | 5,920.00 |
| 4 වසර | 9,615.00 | 10,095.00 | 10,575.00 | 6,120.00 |
| 5 වසර | 9,715.00 | 10,220.00 | 10,725.00 | |
| 6 වසර | 9,815.00 | 10,345.00 | 10,875.00 | |
| 7 වසර | 9,915.00 | 10,470.00 | 11,025.00 | |
| 8 වසර | 10,015.00 | 10,595.00 | 11,175.00 | |
| 9 වසර | 10,115.00 | 10,720.00 | 11,325.00 | |
| 10 වසර | 10,215.00 | 10,845.00 | 11,475.00 | |
| 11 වසර | 10,315.00 | 10,970.00 | 11,625.00 | |
| 12 වසර | 10,415.00 | 11,095.00 | 11,775.00 | |
| 13 වසර | 10,515.00 | 11,220.00 | 11,925.00 | |
| 14 වසර | 10,615.00 | 11,345.00 | 12,075.00 | |
| 15 වසර | 10,715.00 | 11,470.00 | 12,225.00 | |
| 16 වසර | 10,815.00 | 11,595.00 | 12,375.00 | |
| 17 වසර | 10,915.00 | 11,720.00 | 12,525.00 | |
| 18 වසර | 11,015.00 | 11,845.00 | 12,675.00 | |
| 19 වසර | 11,115.00 | 11,970.00 | 12,825.00 | |
| 20 වසර | 11,215.00 | 12,095.00 | 12,975.00 | |
| 21 වසර | 11,315.00 | 12,220.00 | 13,125.00 | |
| 22 වසර | 11,415.00 | 12,345.00 | 13,275.00 | |
| 23 වසර | 11,515.00 | 12,470.00 | 13,425.00 | |
| 24 වසර | 11,615.00 | 12,595.00 | 13,575.00 | |
| 25 වසර | 11,715.00 | 12,720.00 | 13,725.00 | |

11 - 377/5

---

**පඩිපාලක සභා ආඥා පනත**

නිවේදනයයි

**මේස් භාණ්ඩ (හෝසියරි) නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥා පනතේ 30 වැනි වගන්තියෙන් මේස් භාණ්ඩ (හෝසියරි) නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එම උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව යෝජනා කරන බව එකී ආඥා පනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2012 නොවැම්බර් මස 21 දින මධ්‍යහ්න 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු සෑම විරෝධතාවක්ම ලියවිල්ලකින් විය යුතු අතර, විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතුය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
මේස් භාණ්ඩ (හෝසියරි) නිෂ්පාදන
කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

මේස් භාණ්ඩ (හෝසියරි) නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරන ලදුව, 1966 දෙසැම්බර් මස 09 වැනි දින අංක 14725 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ සහ අවසන් වරට 2010 ජුනි මස 30 දින අංක 1660/35 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දා වූ ද තීරණ එහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශය කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

II කොටස

**මසකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

I වැනි **ශ්‍රේණිය**

ප්‍රධාන කම්කරුවෝ නොහොත් ප්‍රධානියෝ, අංශ පරිපාලකවරු, ලේයින්මැෂින් ක්‍රියාකරවන්නෝ.

II වැනි **ශ්‍රේණිය**

කියර් බොයිලේරු ක්‍රියාකරවන්නෝ, වාෂ්ප බොයිලේරු ක්‍රියාකරවන්නෝ, සෝදන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, සායම් පොවන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, ස්ටැන්ටෙක්සින් යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, මිරිකන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, කැලැන්ඩර කරන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, වේලන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, යන්ත්‍ර මැකැනික්වරු (සාමාන්‍ය), සායම් පොවන්නෝ (පිරිමි), ගොතන යන්ත්‍ර මැකැනික්වරු, ස්ක්‍රීන් මුද්‍රණකරුවෝ, ස්ක්‍රීන් මුද්‍රණ ක්‍රියාකරවන්නෝ (ගැහැණු), ස්ක්‍රීන් මුද්‍රණ කරන සහායකයෝ, මහන යන්ත්‍ර මිකැනික්වරු.

III වැනි **ශ්‍රේණිය**

රෙදි අතුරන කම්කරුවෝ (ගැහැණු), කපන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, විදුලි බලයෙන් ක්‍රියාකරන කපන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, කපන්නෝ (අතින්), මහන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, රෙදි තම්බන කම්කරුවෝ, සුදු කරන්නෝ (පිරිමි), ගොතන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, අලුත්වැඩියා කරන කම්කරුවෝ (ගැහැණු), ට්‍රිම් කරන කම්කරුවෝ (ගැහැණු), මදින කම්කරුවෝ (ගැහැණු), මදින කම්කරුවෝ (පිරිමි), විදුලි බලයෙන් රෙදි මදින යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, හරි වැරදි බලන කම්කරුවෝ (ගැහැණු), තෝරන කම්කරුවෝ (ගැහැණු), අසුරන්නෝ, අසුරන හා මුද්‍රා තබන කම්කරුවෝ (ගැහැණු), සපත්තු ලේස් කෝඩ් සාදන සහ වෙන්කරන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, සෙලෝපේන් මලු සහ කාඩ්බෝඩ් පෙට්ටි සාදන්නෝ, ඔතන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ.

IV වැනි **ශ්‍රේණිය**

ආධුනිකයෝ හෝ වෘත්තීය හදාරන්නෝ (ඉහත සඳහන් වෘත්තීය හදාරන්නෝ හෝ ආධුනිකයෝ සම්බන්ධයෙන් ආධුනික කාලය වැඩකරන දින 156කින් යුක්ත වූ කාලසීමාවන් ලෙස සැළකිය යුතුය.)

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| *සේවා වසර* | *I ශ්‍රේණිය රු. ශත.* | *II ශ්‍රේණිය රු. ශත.* | *III ශ්‍රේණිය රු. ශත.* | *IV ශ්‍රේණිය රු. ශත.* |
|---|---|---|---|---|
| 1 වසර | 9,750.00 | 9,360.00 | 8,970.00 | 5,635.00 |
| 2 වසර | 9,900.00 | 9,485.00 | 9,070.00 | |
| 3 වසර | 10,050.00 | 9,610.00 | 9,170.00 | |
| 4 වසර | 10.200.00 | 9,735.00 | 9,270.00 | |
| 5 වසර | 10,350.00 | 9,860.00 | 9,370.00 | |

11 - 377/6

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.